# පුවත්පත් නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) 2015 නොවැම්බර්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නවතම පාරිභෝගික මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය 2015 ඔක්තෝම්බර් මස සිට අදාල ලිත් මාසය අවසන් වී දින 21 පසු ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2015 නොවැම්බර් මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 112.0 ලෙස ප්‍රකාශයට පත් කර ඇත. නොවැම්බර් මාසයේ දර්ශකය ඔක්තෝම්බර් මාසයේ දර්ශකය (109.2) හා සංසන්දනය කල විට 2.8ක දර්ශකාංක වැඩිවීමක් හා ප්‍රතිශතයක් ලෙස 2.6 ක වැඩිවීමක් වාර්තා වේ. මේ සඳහා ආහාර කාණ්ඩයේ 2.1% ක වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ 0.5% ක වැඩිවීම බලපා ඇත.

ආහාර කාණ්ඩයේ වැඩිවීම සඳහා එළවළු, අමු මිරිස්, සහල්, ලොකුළුණු, අර්තාපල්, පොල්, දෙහි, රතුළූණු, අළුත් මාළු සහ වියළි මිරිස් යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි සැළකිය යුතු වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් අඹ, පැපොල්, කුකුල් මස්, බිත්තර, වියළි හාල්මැස්සන් හා කෙසෙල් යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි සුළු අඩුවීමක් වාර්තා වී ඇත.

2015 ඔක්තෝම්බර් මාසය හා සසඳන කල නොවැම්බර් මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ 0.5%ක වැඩිවීමක් දක්නට ඇත. මේ සඳහා 'ප්‍රවාහන' හා 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් භාණ්ඩවල මිලෙහි වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත.'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' යන කාණ්ඩයේ සුළු අඩුවීමක් පෙන්නුම් කරනුයේ L.P ගෑස් සඳහා වූ මිල අඩු වීමයි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2015 නොවැම්බර් මාසය සඳහා වාර්ෂික උද්ධමනය 4.8% ක් ලෙස ගණනය කොට ඇති බවත්, 2015 ඔක්තෝම්බර් මාසය සඳහා එම අගය 3.0 % ක් ලෙස වාර්තා වූ බවත් සඳහන් කලේය .

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන අංක: 011-2147001 / 011-2147020